කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
விவசாயத் திணைக்களம்
DEPARTMENT OF AGRICULTURE

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය
பீடைகொல்லி பதிவு அலுவலகம்
Office of the Registrar of Pesticides

අංක 1056, ගැටඹේ, තැ.පෙ. 49, පේරාදෙණිය 20400, ශ්‍රී ලංකාව
இல 1056, கெடம்பே, த.பெ.இல 49, பேராதனை 20400, இலங்கை
No. 1056, Getambe, P.O. Box 49, Peradeniya 20400, Sri Lanka

දුරකථන/தொலைபேசி/Telephone : (94)812388076/388135
ෆැක්ස්/தொலைநகல்/Fax : (94)812388135
ඊ මේල්/மின்னஞ்சல்/E-mail : pest@slt.lk
වෙබ්/மின்னஞ்சல்/Web : www.doa.gov.lk

මගේ අංකය / எனது எண் / My No: RP/VIII/I2

ඔබේ අංකය / உமது எண் / Your No:

දිනය / திகதி / Date: 2018.11.02

චක්‍රලේඛ/ආර්.ඕ.පී/පී.සී.එස්/2018/2-1

සියලුම ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන ප්‍රධානීන් වෙත,

**අධි අවදානම් ඩෙංගු වාහක මදුරුවන් බෝවීම පාලනය කිරීමේ දී ලියාපදිංචි පළිබෝධ පාලන ආයතන සතු කාර්යභාරය**

උක්ත කරුණ සම්බන්ධයෙන් 2018.09.05 දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක ආර්.ඕ.පී/පී.සී.එස්/2018/2 ට ව්‍යතිරේකව යි.

02. එහි සඳහන් කරන ලද කීටනාශකවලට අමතරව 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ ලියාපදිංචි කර ඇති පහත සඳහන් නිෂ්පාදනය ද ලේබලයේ සඳහන් නිර්දේශ ප්‍රකාරව මදුරු කීටනාශනය සඳහා භාවිතා කළ හැකි බව මෙයින් දැනුම් දෙමි.

- නිෂ්පාදනයේ පොදුනාමය- නොවැලියුරෝන් (Novaluron)
- නිෂ්පාදනයේ වෙළෙඳනාමය- රිමොන් 10 ඊ.සී. (Rimon® 10 EC)
- අනුමත ඇසුරුම් ප්‍රමාණ- මිලි ලීටර් 25, 50, 100, 200, 400 (Novaluron)
- යෙදීමේ අනුපාතය- ජලය ලීටරයක මිලි ලීටර් 2 ක් (2 ml/L of water)
- අලෙවි සමාගම- සී.ස. ඒ බවර් සහ සමාගම (A Baur & Co. Limited)

03. නොවැලියුරෝන් (Novaluron) යනු කයිටීන් නිශේධක (chitin biosynthesis inhibitor) කෘමි වර්ධක පාලකයකි. ඒ මඟින් මදුරු කීටයින්ගේ හැවහැළීමේ ක්‍රියාවලිය අඩපණ කර මදුරු කීටයින් සුහුඹුල් මදුරුවන් බවට පත්වීම වලක්වනු ලැබේ. සාර්ථක සහ දිගුකාලීන මදුරු කීට මර්දනය සඳහා මතුපිට ජල ස්ථරයේ මදුරුවන් බිත්තර තැන්පත් කිරීමට පෙර (preventative application) හෝ බිත්තර තැන්පත් කිරීමෙන් වහාම පසුව හෝ පළමු කීට අවස්ථා බිහිවීමත් සමග හෝ ඊට සමගාමීව රසායනය යෙදිය යුතුය.

04. බීමට ගන්නා ජලයට හෝ ජීවී ජල පද්ධති සඳහා නොයෙදිය යුතුය.

ආචාර්ය ජේ.ඩී. සුමිත්
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්

පිටපත් -

1. ලේකම් - සෞඛ්‍ය හා පෝෂණ කටයුතු අමාත්‍යාංශය -කා.දැ.ස.
2. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් -කා.දැ.ස.
3. අධ්‍යක්ෂ - මැලේරියා මර්දන ඒකකය -කා.දැ.ස.
4. අධ්‍යක්ෂ - ජාතික ඩෙංගු මර්දන ඒකකය -කා.දැ.ස.